දිනය: 2021-05-13
අංකය: 08

SRI LANKA
IMMIGRATION AND EMIGRATION

# මාධ්‍ය නිවේදනයයි
# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

මෙම කොවිඩ් -19 වසංගතය තත්වය යටතේ අවම සේවක සංඛ්‍යාවක් කැඳවමින් සේවාවන් පවත්වා ගෙන යනු ලැබේ. ඒ අනුව **හදිසි සහ අත්‍යවශ්‍ය අවස්ථාවක දී විදේශ ගමන් බලපත්‍ර** ලබා දීම සඳහා බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලය විවෘතව පවතින අතර, සංචරණ සීමාවන්ට යටත්ව ප්‍රාදේශීය කාර්යාල වෙත පැමිණිය හැකි අත්‍යවශ්‍ය සේවා අවශ්‍යතා ඇති සේවාලාභීන් වෙනුවෙන් ද **මහනුවර, වවුනියාව, මාතර සහ කුරුණෑගල** යන ප්‍රාදේශීය කාර්යයාල විවෘතව පවතී.

එසේම දැනට ශ්‍රී ලංකාවට පැමිණ සිටින විදේශකයන් ලබා ගෙන ඇති **සියලු වර්ගයේ වීසාවන්හි** වලංගු කාලය **2021 මැයි මස 11 වන දින සිට 2021 ජුලි 09 වන දින දක්වා දින 60** කින් දීර්ඝ කරන ලදී. මෙම කාල සීමාව තුළ කල් ඉකුත්වන වීසා සඳහා එම කාල සීමාවට අදාල වීසා ගාස්තු පමණක් අය කරනු ලබන අතර කිසිදු දඩ මුදලක් අය කරනු නොලැබේ.

**<u>• සංචාරක වීසා දරන්නන් හට වීසා පිටසන් කරගැනීමට උපදෙස්;</u>**

ඒ අනුව සංචාරක වීසා දරන්නන් එම වීසා දීර්ඝ කිරීමට අදාළව වීසා ගාස්තු ගෙවීම හා වීසාව පිටසන් කර ගැනීමට පහත ක්‍රමවේදයන් අතරින් එක් ක්‍රමවේදයක් භාවිතා කළ හැක;

1. https://eservices.immigration.gov.lk/vs දරන වෙබ් අඩවියට පිවිස අදාළ ගාස්තු ගෙවා මාර්ගස්ථ ක්‍රමවේදය ඔස්සේ වීසා ලබා ගැනීම හෝ;

2. මෙම කාලය තුළදී දිවයිනෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම් අදාළ වීසා ගාස්තු ගුවන්තොටුපල වෙත ගෙවා දිවයිනෙන් බැහැර වීම හෝ;

3. 2021 ජුලි 09 වන දිනට පෙර, සංචරණ සීමාවන්ට යටත්ව බත්තරමුල්ල කාර්යාල වෙත පැමිණ අදාළ වීසා ගාස්තු ගෙවා වීසාව ගමන් බලපත්‍රයේ පිටසන් කරගැනීම.

**<u>• නේවාසික වීසා දරන්නන් හට උපදෙස්;</u>**

2021 මැයි මස 11 වන දින සිට 2021 ජුලි 09 වන දින දක්වා වන වීසා දීර්ඝ කිරීම සියලු නේවාසික වීසා දරන්නන් හටද අදාල වන අතර එදිනට පෙර වීසාව දීර්ඝ කරගැනීමට රාජකාරි දිනවල පෙ.ව. 8:30 සිට ප.ව. 3:00 දක්වා 0707101050 දරන දුරකථන අංකය අමතා දිනයක් හා වේලාවක් වෙන් කොට ගෙන 2021 ජුලි 09 වන දිනට පෙර බත්තරමුල්ල කාර්යාලයට පැමිණ අදාල වීසා ගාස්තු ගෙවා වීසා පිටසන ලබා ගත යුතු ය.

අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා රාජකාරී දිනයන්වල පෙ:ව 8.00 සිට ප:ව 4.30 දක්වා පහත දුරකථන අංක මඟින් හෝ ඊ-මේල් මඟින් අදාල අංශ සම්බන්ධ කොට ගෙන උපදෙස් ලබා ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

| අංශය | දුරකථන අංකය |
|---|---|
| **බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයේ ගමන් බලපත් අංශය** | 0707101060, 0707101070 |
| **බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයේ පුරවැසි අංශය** | 0707101030 |
| **බත්තරමුල්ල කාර්යාලයේ විදේශ දූත මණ්ඩල අංශය** | 0115329233, 0115329235 |
| **බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයේ වීසා අංශය** | 0707101050 |
| **බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයේ තොටුපල අංශය** | 0777782505 |
| **මාතර ප්‍රාදේශීය කාර්යාලය** | 041-5412212, 041-5104444 |
| **වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය** | 025-5676344, 025-5676345 |
| **කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය** | 037-5550562, 037-5550563 |
| **මහනුවර ප්‍රාදේශීය කාර්යාලය** | 081-5624509, 081-5624470 |
| **පොදු උපදෙස් හා තොරතුරු** | www.immigration.gov.lk |

**වැදගත්:**

- සේවාවන් ලබා දීම පවතින වසංගත තත්වය හමුවේ **රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ, ඇඳිරි නීතිය හෝ සංචරණ සීමා පැනවීම්, සෞඛ්‍ය අංශ හා ආරක්ෂක අංශ තීරණයන්ට** යටත් වන බව ද, ඒ අනුව සේවාව ලබාදීම පිළිබඳ තීරණ වරින්වර සංශෝධනය කිරීම්වලට යටත්වන බව ද නිවේදනය කරමි.

පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව